*සැ. යු.-* (i) 2020.03.13 දින පළ වූ අංක 2,167 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2020 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,168 - 2020 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2020.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 522 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 අප්‍රේල් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


521 - B 082019 — 353 (2020/03)
D 1 -

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය)

මුල්ලේරියාව, නව නගරය, උඩුමුල්ල, අංක 380 දරන ස්ථානයෙහි පිහිටි එස් ඇන්ඩ් කේ ඉංජිනියරින් එන්ටප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් සම්බන්ධයෙන් වූ ඉල්ලීමකි.

*නඩු අංකය* : එච්. සී. (සිවිල්)/63/2019/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම
*වටිනාකම* : රු. 167,000,000
*පටිපාටිය* : ලඝු

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

එල්. ඕ. එල්. සී. ෆයිනෑන්ස් පී එල් සී,
ලියාපදිංචි කාර්යාලය, අංක 100/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

.........................................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 යන ලිපිනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි එල්. ඕ. එල්. සී. ෆයිනෑන්ස් පී එල් සී සමාගම විසින් වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 08 වැනි දින වාණිජ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ :

*අත්සන් කළේ* :- නුවන් ජයසිංහ,
අංක 22,
ෂේඩ් ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

*සටහන*.- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් නුවන් ජයසිංහ වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 26 වැනි දින පස්වරු 6.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතු ය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතුය.

නුවන් ජයසිංහ,
අංක 22,
ෂේඩ් ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

03-888

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.